**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු SA71, SA81හා SA90 ආකෘති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 ඡේදය ප්‍රකාරව ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

**අත්තිකාරම් ගිණුම් ශේෂ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුම් ශේෂය ලෙස රු.107,489,611 ක් දැක්විය යුතු වුවද, එය රු.93,702,069 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ වත්කම් රු.13,787,542 ක් වැඩියෙන් දැක්වුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂයෙන් විවිධ අත්තිකාරම් පියවීම් අඩු නොකළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පරිපූරක ඇස්තමේන්තු සම්මත කරගත යුත්තේ අත්‍යාවශ්‍ය හදිසි වියදම් සඳහා පමණක් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂයය 3 ක් වෙනුවෙන් රු.367,000,000 ක ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තු යටතේ සම්මත කර ගෙන තිබුණි. එම ප්‍රතිපාදන වල ඉතිරිය සියයට 14 ත් සියයට 88 ත් අතර පරාසයක පැවතුණි. | කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ පවුල් සඳහා රු.2,000 දීමනා ගෙවීමට, යල කන්නයේ වී මිලදී ගැනීමට සහ කාබනික පොහොර නිශ්පාදනය හා මිලදී ගැනීම සඳහා වැය විෂයයන් යටතේ ද පරිපූරක ප්‍රතිපාදන වෙන් කර දී ඇති බව දන්වා ඇත. | සැලසුම් කර අවශ්‍ය ප්‍රමාණයට පමණක් පරිපූරක ඇස්තමේන්තු සම්මත ගැනීමට කටයුතු යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017(අ) ප්‍රකාරව සේවාවන් ලබාගත් පසු ඒ සඳහා ගෙවීමට ඇති මුදල බැරකම් ලෙස හඳුනාගත යුතු වුවත්, සැපයුම් හා සේවාවන් සම්බන්ධයෙන් ගෙවිය යුතු රු.727,416 ක මුදල මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවාව සපයා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.3,508,875 ක් වූ බැදීම් හඳුනාගෙන බැරකම් ප්‍රකාශය තුල දක්වා නොතිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017(අ) ප්‍රකාරව ඉදිරියෙදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරන ලද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.3,385,751 ක් වැයකර හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකර තිබූ එල්බී 04 පාලම හා කුඩා වරාහේන පාලම ප්‍රතිසංස්කරණය යටතේ පාලම් දෙපස පස් පුරවා තැලීම සිදුකර නොතිබුණි. | විගණන විමසුම් මඟින් පෙන්වා දි ඇති වැඩ කොටස් ඉටුකිරිම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ සෘජු ප්‍රතිපාදන යොදා ගෙන එම කාර්යයන් ඉටු කිරිමට සැලසුම් කර ඇත. | රජයේ මුදල් නිෂ්කාර්ය නොවන අන්දමින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි ලෙස ඉදිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු හා දෙවන අදියරේ පිළිවෙලින් සමිති 11 ක් හා සමිති 45 ක් අක්‍රීය බව හඳුනාගෙන තිබුණි. එම සමිති සඳහා යටිතල පහසුකම් සංවර්ධන, ධාරිතා සංවර්ධන හා ජීවනෝපාය සංවර්ධන අරමුදල් සඳහා ලබාදී තිබුණු එකතුව රු.14,685,474 ක් බැංකු ගිණුම්වල නිෂ්කාර්යව පැවතුණි. | ගිණුම්වල පවතින මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ගැනීමට හෝ සක්‍රීය මට්ටමට ගෙන ආ හැකි සමිති වල අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු යොදන බව දන්වා ඇත. | සමිති ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගැනීමට කටයුතු කළ යුතු අතර අරමුදල් උපයෝජනය සම්බන්ධව පසු විපරම් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු හා දෙවන අදියරේ සක්‍රීය සමිති සඳහා ලබාදුන් පිළිවෙලින් රු.4,578,358 හා රු.704,347 ක් බැංකු ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි. | නිෂ්කාර්යව පවතින අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු යොදන බව දන්වා ඇත. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීම සම්බන්ධව පසුවිපරම් ක්‍රියාවලිය සිදු කළ යුතුය. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විගණකාධිපති වාර්තාව අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවක් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි | ඉදිරියේදි නියමිත කාල රාමු තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 2.6 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | ඉදිරියේදි පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. | - | එම - |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 1958 අංක 29 හා 1964 අංක 20 දරන සතුන් ඝාතනය කිරීමේ පනත | - | එක් දිනක් තුල සතුන් ප්‍රවාහනය කළ යුතු වුවත්, තමන්කඩුව, වැලිකන්ද හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගවයන් ප්‍රවාහනය කිරීම සඳහා දින කිහිපයක් ගතවන පරිදි බලපත්‍ර 98 ක් නිකුත් කර තිබුණි. | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාල බලපත්‍රයේ වේලාව සටහන් කර "එම දිනයේදි පමණක් ප්‍රවාහනය වලංගුවේ" ලෙස සටහනක් යොදා ඇති බවත් මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, විමර්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව හා තමණ්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරියෙදි මෙම වරද නිවැරදි කිරිමට කටයුතු කරන බවත් දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද හා 2019 ජුනි 27 දිනැති අංක 5/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 1,386,622 | සේවය හැරගිය, මියගිය හා වැඩතහනමට ලක්වූ සේවකයන් දෙදෙනෙකු, තුන්දෙනෙකු හා එක් අයෙකුගෙන් පිළිවෙලින් අයවිය යුතු රු.225,075, රු.753,509 හා රු.408,048ක් පිළිබඳව ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂයන් අයකර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 396(ඇ) | 1,183,346 | 2019 ජුනි 26 දින සිට 2021 ජූලි 30 දක්වා මාස 6 ක කාලය ඉකුත් වූ චෙක්පත් 63 ක් පොදු තැන්පතු ගිණුමට බැර කර බැංකු සැසඳුම නිරවුල් කර තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | 2014 ජනවාරි 03 දිනැති දිවි නැගුම ප්‍රජාමූල බැංකු වැඩසටහන මැයෙන් දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛයේ 8.5 ඡේදය | | වැලිකන්ද හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල, ණය මුදල රු.250,001 සිට රු.1,000,000 දක්වා සීමාව තුල ලබා දෙන ණය සඳහා චංචල / නිශ්චල දේපලක් ඇපකර ලෙස තබා ගත යුතු අතර, එම වත්කම් සමෘද්ධි බැංකුව නමින් ලියාපදිංචි කළයුතුය. එහෙත් වැලි කන්ද හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ණය ලබාදීමේදී ඇපයට තබා ගන්නා වත්කම් ලියාපදිංචි | විගණන නිරීක්ෂණය සමඟ එකඟවන බව දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අදාල වත්කම් බැංකුව මඟින් ලියාපදිංචි කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කිරීමකින් තොරව ලබා දී තිබුණි. මේ හේතුවෙන් ණය පැහැර හැරීමකදී අදාළ වත්කම් බැංකුව නමින් අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ඉ) | අංක 2014/7 දරන දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල්ගේ දිවි නැගුම චක්‍රලේඛයෙහි 6 වගන්තිය | රු.3,385,327 | නිවාස ණය (ගෘහ ඒකක ණය) ලබා දිය හැකි උපරිම සීමාව රු. 300,000 ක් ලෙස දක්වා ඇතත්, කළමනාකරණයේ අභිමතය මත 2017 හා 2018 වර්ෂවලදී පුද්ගලයන් එකොලොස් දෙනෙකු වෙත රු.500,000 බැගින් ගෘහ ඒකක ණය රු.5,500,000 ක් නිකුත් කර තිබුණි. එම ණය වලින් අයකර ගත යුතු එකතුව රු.3,385,327 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට බොල් ණය ලෙස වෙන් කර තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟවන බව දන්වා ඇත. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ණය යාවත්කාලීනව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.6 වංචනික ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි නිලධාරීන් පස් දෙනෙකු විසින් සිදු කරන ලද මූල්‍ය වංචාවෙන්, තවදුරටත් අදාළ නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ මුදල රු.652,167 ක් 2022 මැයි දක්වාම අය කරගෙන නොතිබුණි. | අදාල නිලධාරීන් විසින් රු.1,758,450 ක මුදලක් ගෙවා ඇති අතර ඉතිරි මුදල් අයකර ගන්නා අකාරය සම්බන්ධයෙන් විනය නියෝගයේ සඳහන් කර නොමැති බව දන්වා ඇත. | අදාල මුදල් අයකර ගැනීමටත් වගකිව යුතු නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය . |
| (ආ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 ජූනි 11 දින සිට 2021 මැයි දක්වා කාලය තුළ වැඩිහිටි දීමනා හා වකුගඩු දීමනා ගෙවීම් කිරීමේදී සිදුවී තිබූ රු.2,443,600 ක මූල්‍ය අක්‍රමිකතාවය අදාළ නිලධාරියාගෙන් අයකර තිබුණද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමු උපලේඛනය යටතේ වන වරදක් බව අනාවරණය වුවද, එම නිලධාරියා සම්බන්ධයෙන් වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත් කිසිදු විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මූලික විමර්ශනයේ වාර්තාව හා චෝදනා පත්‍රයේ කෙටුම්පත විධිමත් විනය පරීක්ෂණයක් සිදුකිරීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇති බව දන්වා ඇත. | විනය පරීක්ෂණ කටයුතු අප්‍රමාදව සිදු කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 සැලැසුම් කිරීම

-----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබූ ව්‍යාපෘති 08 ක් වෙනුවට වෙනත් ව්‍යාපෘති 07 ක් ඉටු කර තිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්වූ පවුල් සඳහා රු.5,000 ක දීමනාවක් අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්ගේ අංක PTF/03/2021 හා 2021 අප්‍රේල් 10 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව 2021 අප්‍රේල් සහ ජූනි මාසවල අවස්ථා දෙකකදී ගෙවීම් කර තිබුණි. එහිදී සමෘද්ධිලාභීන් සඳහා අදාළ දීමනාව ලබාදීමේදී මාසිකව රු.22,000 ක පුහුණු දීමනාවක් ලබමින් සිටින බහුකාර්යය සංවර්ධන සහායක පුහුණු ලාභීන් සඳහාද රු.5,000 ක එම දීමනාව ලබාදීමට කටයුතු කර තිබුණි. ඒ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බැංකු සංගම් 19 කට අදාළ පවුල් 421 ක් සඳහා රු.4,190,000 ක් ගෙවීම් කර තිබුණි. | බහු කාර්ය සංවර්ධන පුහුණු සහයකයින් සිටින පවුල් සඳහා එම දීමනාව ලබා නොදෙන ලෙස සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් ලබා දී නොමැති බව දන්වා ඇත. | ආදායම් අහිමි පවුල් සඳහා පමණක් අදාළ ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද ගම්පෙරලිය සංවර්ධන වැඩසටහන - 2019 යටතේ ප්‍රතිලාභීන් 37 ක් වෙත ලබා දී තිබූ සෙවිලි තහඩු 496 ක් හා ප්‍රතිලාභීන් 15 දෙනෙකු වෙත ලබා දී තිබූ සිමෙන්ති උර 189 ක් අන්සතු කිරිම, විකිණීම හා අස්ථාන ගත කිරීම සිදුකර තිබූ අතර, ප්‍රතිලාභීන් 247 ක් වෙත ලබා දී තිබූ සෙවිලි තහඩු 3,679 ක් හා සිමෙන්ති උර 54 ක් භාවිතයට ගෙන නොතිබුණි. | ප්‍රතිලාභීන් සඳහා ලබා දුන් භාණ්ඩ එම කාර්ය සඳහාම යොදවා ගත්තේද යන්න පසුවිපරම් සිදු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. | ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී නිසි අධ්‍යානයකින් අවශ්‍යතාවය පවතින ප්‍රතිලාභීන් තෝරා ගත යුතුය. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හිඟුරක්ගොඩ හා ඇළහැර විදුලි වැට ආශ්‍රිත මුර කුටි 28 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.22,949,234 කට ලබා දී තිබුණු අතර 2021 පෙබරවාරි 20 දින වැඩ නිම කළ යුතු වුවත්, 2022 පෙබරවාරි 25 දිනවන විටත් නිම කර නොතිබුණි. තවද ප්‍රමාණ පත්‍රයන්යන්හි අයිතම 29 ක් යටතේ දක්වා තිබූ රු.13,552,179 ක් වූ වැඩ කොටස් කොන්ත්‍රාත්කරු විසින් ඉටු නොකර අත්හැර | අදාල කාර්යයන් කඩිනමින් නිමකර දිස්ත්‍රික් ලේකම් වෙත භාර දෙන ලෙස කොනත්‍රාත්කරුට දන්වා ඇත. විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බවද දක්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු අතර නොඑසේනම් අසාදු ලේඛන ගත කිරීමට කටයුතු කළ යුතුය. කාර්යසාධනය දීර්ඝ කර නොගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු අයට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දමා තිබුණි. මේ හේතුවෙන් වැය කළ රු.6,556,819 ක වියදම නිෂ්ක්‍රීය වියදමක් වී තිබුණි. තවද අත්හැර දැමීම සම්බන්ධයෙන් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරු වෙත රු.2,074,645 ක අධි ගෙවීමක් සිදු කර තිබුණි. කාර්යසාධන සුරක්ෂණ කාලය ඉකුත් වී තිබුණු අතර කාලය දීර්ඝ නොකිරීම නිසා කොන්ත්‍රාත්තුව පැහැර හැරීම සම්බන්ධයෙන් වූ අලාභය අයකර ගැනීමට හැකියාවක් නොතිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු අයට එරෙහිව විනය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. | | |
| (ආ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රු.6,848,004 ක වටිනාකමකට ගිවිසුම් ගත වී තිබුණු සංවර්ධන ව්‍යාපෘති 06 ක් විගණිත දිනය වූ 2022 මාර්තු 10 දින වන විටත් ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | එකතුව රු.6,848,004 ක ගිවිසුම් ගත වටිනාකමක් සහිත ව්‍යාපෘති 06 ක වැඩ අවසන් කර නැති බව දන්වා ඇත. | ගිවිසුම්ගත වූ කාර්යයන් නියමිත පරිදි ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද දිඹුලාගල අලිවැට ආශ්‍රිත | කඩිනමින් වැඩ නිමකර භාර දෙන ලෙසත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය | ගිවිසුම ප්‍රකාරව නියමිත දිනට ව්‍යාපෘතිය ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුරකුටි 13 ක් ඉදි කිරීම 2022 ජනවාරි 30 දින වැඩ අවසන් විය යුතු වුවත් ප්‍රමාණ පත්‍රයන්හි රු.3,422,064 ක් වූ අයිතම් 8 ක් 2022 පෙබරවාරි 28 දින වන විටත් ඉටුකර නොතිබුණි. | කටයුතු සිදු කරන ලෙසත් කොන්ත්‍රාත් ආයතනය වෙත දන්වා ඇත. | |
| (ආ) | ගම සමඟ පිළිසඳර වැඩසටහන 2021 මඟින්, ඉදිකිරීම් ආරම්භ කරන ලද වෙඩිකඩව්විය ප්‍රදේශයේ ක්‍රීඩා පිටි 02 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව 2021 දෙසැම්බර් 25 දින වැඩ නිම කළ යුතු වුවත්, එම වැඩ නිමකර නොතිබියදී තාක්ෂණික නිලධාරි විසින් සාවද්‍ය ලෙස වැඩ නිමකළ බවට නිර්දේශ කිරීම මත අවසන් බිල්පත සඳහා රු.4,486,004 ක් ගෙවීම් කර තිබුණි. එසේම 2022 මාර්තු 08 දින වන විටත් වැඩ නිම කළ යුතු දිනය ඉක්මවා දින 72 ක් ගතවී ඇතත් ඒ සඳහා අයවිය යුතු රු.80,748 ක ප්‍රමාද ගාස්තු අඩුකර ගැනීමටද මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ වැඩ ඉතා කඩිනමින් අවසන් කර මහජනතාවට භුක්තිවිඳීමට දීමේ අරමුණින්, ව්‍යාපෘතියේ වැඩ අවසන්කර දීම සඳහා මුදල් ගෙවා ඇත. | සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

**3.6 ප්‍රසම්පාදනයන්**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ------------ |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව හා ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.1 ඡේදයෙහි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉදිරියෙදි කටයුතු කරන බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තමන්කඩුව සහ ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | | |
| (ආ). | එකතුව රු.38,739,927 ක ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 10 ක් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව නියමිත දිනට ඉදි කිරීම් අවසන් නොකිරීම මත රු.1,067,937 ක් ප්‍රමාද ගාස්තු ප්‍රාදේශීය ලේකම් වෙත අයවිය යුතු ව තිබුණද 2022 මැයි වන විටත් අයකර ගෙන නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකරගතයුතු කොන්ත්‍රාත්කරුවන්ගෙන් එය අයකර ගැනීමටත් ද්‍රව්‍ය මිල ඉහළ යෑම වැනි හේතූන් මත ප්‍රමාද ගාස්තු අය කිරීම සාධාරණ නොවන බව හැගෙන කොන්ත්‍රාත් කරුවන් පිළිබඳව තවදුරටත් සලකා බැලීමටත් කටයුතු කරන බව දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7. වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 04 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ භාවිතයට ගැනීමට නොහැකි නම් අපහරණය කිරීමට හෝ කටයුතු නොකර වර්ෂ 02 සිට 05 කට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි | යතුරු පැදි දෙක හා බවුසරය සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලය මඟින් ලබාදෙන නිර්දේශ මත ද, ට්‍රැක්ටරය සම්බන්ධයෙන් සමාජසේවා දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙන නිර්දේශ මත ද ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇත. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදී තිබුණු රු.1,450,194 ක් වටිනා ඉංජිනේරු ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණු අතර, එම භාණ්ඩ නිෂ්කාර්යව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගබඩා කර තිබුණි. | ඉන්වෙන්ට්‍රි පොත් වලට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර කාර්යාලීය නඩත්තු සඳහා මෙම උපකරණ භාවිතයට ගනිමින් පවතී. | ඉංජිනේරු ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කළ යුතු අතර නිෂ්ක්‍රීයව පවතින භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1983 වර්ෂයේ සිට 2021 ජුනි දක්වා කාලය තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් කුලී, සින්න පදනම මත දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී ඇති නිවාස වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත 2021 ජුනි මස වන විට තක්සේරු වටිනාකම ඉක්මවා නිවාස 07 ක් සඳහා රු.215,226 ක් ගෙවා තිබුණි. තක්සේරු වටිනාකම ගෙවා අවසන් වී ඇති නිවාස වල අයිතිය දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබු අතර කඩා ඉවත් කළ අංක 6 දරන නිවස වෙනුවෙන් රු. 69,998 ක මුදල අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | නිවාසවල අයිතිය දිස්ත්‍රික් ලේකම් වෙත පවරා දෙන ලෙස නිවාස සංවර්ධන අධිකාරියට දන්වා ඇත. | තක්සේරු වටිනාකම ගෙවා අවසන් වී ඇති නිවාස වල අයිතිය දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ගැනීමටත් වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීමටත්, කටයුතු කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිවාස සංවර්ධන අධිකාරිය විසින් කුලී සින්න පදනම මත ලබා දී ඇති රජයේ නිවාස 08 ක් වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව මාසිකව ගෙවිය යුතු නිවාස කුලිය රු.3,525 ක් වුවත්, එම නිවාස 08 සඳහා මාසික කුලී වශයෙන් අයකරනු ලබන රු.28,912 ක මුළු මුදලම නිවාස සංවර්ධන අධිකාරිය වෙත යැවීමට කටයුතු කර තිබීමෙන්, මාසික කුලිය ඉක්මවා නිවාස සංවර්ධන අධිකාරියට යවන ලද මුළු මුදල කොපමණද යන්න හඳුනාගැනීමට අදාළ ලේඛන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නඩත්තු කර නොතිබුණි. | මේ වන විට ලේඛණ නඩත්තු කරමින් පවතී. | මාසික කුලිය නිවැරදිව හඳුනාගෙන ගෙවීම් කළ යුතුයි. |

## 3.8. පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇති සුළු හා මධ්‍ය පරිමාණ මෝල්හිමියන් නගා සිටුවීමේ වැඩසටහන යටතේ පොළොන්නරුව සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය වෙත ලබාදෙන ලද රු.මි. 206 කින් මුදලින් තවදුරටත් අයවිය යුතු රු.මි.65.6 ක් අය වී නොතිබුණි. ඒ සම්බන්ධයෙන්, 2020 අගෝස්තු 24 දින මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය වෙත දන්වා තිබුණද, 2022 මැයි වන විටත් එම මුදල අයකර ගෙන නොතිබුණි | රු.මි.140.4 ක් අය කරගෙන ඇති අතර ඉතිරි ණය පැහැර හැරිම සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත ද දැනුවත් කර ඇති බව දන්වා ඇත. | මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක පවත්වාගෙන ගොස් තිබූ කළුගල් වැඩපොළවල් 43 කින් රජයේ ඉඩම්වල ඛණිජ ද්‍රව්‍ය එකතු කිරීමේ ගාස්තු වශයෙන් අයවිය යුතු රු.142,191,147 ක් අයකරගෙන නොතිබුණි. | ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව මඟින් බලය පවරා ඇති පරිදි භූ විද්‍යා හා පතල් කාර්යාංශය මඟින් රාජ්‍ය භාගය අයකර ඇත. | අදාල ගාස්තු නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ගම්පෙරළිය කඩිනම් සංවර්ධන වැඩසටහන හා පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් වෙත ලබාදීම සඳහා දිස්ත්‍රක් ලේකම් කාර්යාලය මඟින් මිලදීගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ සෙවිලි තහඩු වලින්, පළුදු වූ සෙවිලි තහඩු 864 ක් විය. ඒවා මිලදීගෙන වර්ෂ 3 කට අධික කාලයක් ගත වී ඇතත්, | සැපයුම්කරු වෙතින් නව සෙවිලි තහඩු ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා ඇත. | සැපයුම්කරු වෙතින් නව සෙවිලි තහඩු ලබාගැනීමට හෝ මුදල් අයකර ගැනීමෙන් රජයට සිදු වූ අලාභය පියවාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තහඩු නැවත භාරදී අලුත් තහඩු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම සෙවිලි තහඩුවල වර්තමාන වෙළඳපල වටිනාකම රු.3,554,345 ක් විය. | | |
| (ඇ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාවිතා කරන වාහනයක් 2005 පෙබරවාරි 09 දින සිදු වූ අනතුරින් වූ රු.250,000 ක අලාභය සඳහා අනතුර සිදුකළ පාර්ශවයේ තෙවන පාර්ශව රක්ෂණාවරණය මඟින් රු.100,000 ක මුදලක් ලබා දීමට එකඟ වී තිබුණද නියමිත කාලය තුළ එම මුදල ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම මුදල ද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | තෙවන පාර්ෂව රක්ෂණ ආවරණය සඳහා ලබා දෙන රු.100,000 ක මුදල රක්ෂණ ආයතනය මඟින් ලබා දී නොමැති බවත්, අලාභයේ ඉතිරි වටිනාකම, ලොරි රථයේ රියදුරු අනුයුක්ත කරනු ලැබූ පුද්ගලික ආයතනය විසින් ගෙවිය යුතු බව ටෙලිකොම් ආයතනය විසින් දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා ඇත. | නියමිත කාලය තුල තෙවන පාර්ශව රක්ෂණ ආවරණය ලබාගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කළ යුතුය. |

## 3.9. විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2021 හා 2022 වර්ෂයේ නිකුත් කරන ලද පිළිවෙලින් විගණන විමසුම් එකකට හා පහකට 2022 ජුනි 21 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. | විගණන නිර්ක්ෂණය සමඟ එකඟවන බව දන්වා ඇත. | විගණන පනතේ විධි විධාන ප්‍රකාරව විගණන විමසුම් සඳහා නියමිත කාල රාමුව තුල පිළිතුරු ලබාදිය යුතුය. |

## 3.10 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා 2019/20 මහ, 2020 යල, 2020/21 මහ කන්න සඳහා සුළු පරිමාණ වී මෝල් හිමියන් හරහා වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ වී ලබාගත් මෝල් හිමියන් 44 දෙනෙකු විසින් මිළදී ගන්නා ලද වී කිලෝ ග්‍රෑම් 1,521,337 ක් සහල් බවට පත්කර රජයට ලබානොදීම හේතුවෙන් තවදුරටත් රජයට අයවිය යුතු මුදල රු.85,181,090 ක් වී තිබුණි. මෙම මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රජයට ලැබිය යුතු සහල්වල වටිනාකමට මුදල් ගෙවන ලෙස මෝල් හිමියන් දැනුවත් කර ඇති අතර ගෙවීම් පැහැර හරින ලද පුද්ගලයන්ට විරුද්ධව නිතීමය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත | රජයට ලැබිය යුතු සහල් තොග ලබා ගැනීමට හෝ එහි වටිනාකමට මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු අතර වර්ෂ 2 කටත් වඩා ඉකුත් වී ඇති මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ) විශ්‍රාම වැටුප්** | | |
| i. 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 හා 2014 ජනවාරි අංක 1/2014 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව ජීවන වියදම් දීමනාව සහිත රජයේ වැටුපක් ලබයිනම්, එම වැටුප් ලබන කාල සීමාවේ විශ්‍රාම වැටුපක්ද ලබයි නම්, විශ්‍රාම වැටුප සඳහා ජීවන වියදම් දීමනාව හිමි නොවිය යුතුය. ඊට පටහැනිව වයස අවුරුදු 55 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වැටුප් හා දීමනා ගෙවනු ලබන නිලධාරීන් හයදෙනෙකු සඳහා තමන්කඩුව හා ඇලැහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනාවද, ගෙවීම් කර තිබීම නිසා රු.1,225,242 ක අධි ගෙවීම් සිදුවී තිබුණි. | අධි ගෙවීම් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩියෙන් ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **ii.** | යළි විවාහ වන වැන්දඹුවකට විශ්‍රාම වැටුප් ගෙවීමේදී, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් සියයට 50 ක් ගෙවනු ලබයිනම්, එය විශ්‍රාම වැටුප සමඟ ගෙවන සියළු දීමනා වලින් සියයට 50 ක් විය යුතු වුවද. එය නොසලකා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා ලද ප්‍රතිලාභියෙකු, නැවත විවාහ වීමෙන් පසුවද ඇය වෙත ගෙවන ලද වැඩිපුර මුදල් ගණනය කර අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ලැබූ මියගිය රණවිරුවකුගේ වැන්දඹුව වෙත නැවත විවාහ වීමෙන් පසුවද එනම්, 2019 ජනවාරි 10 දින සිට 2019 සැප්තැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන් රු.237,942 ක වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි. | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාල විශ්‍රාම වැටුප් ගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බව දන්වා ඇති අතර ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විගණන නිරික්ෂණ සමඟ එකඟවන බව දන්වා ඇත. | වැඩිපුර කළ ගෙවීම් නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **iii.** | ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මිය ගිය පොලිස් සැරයන් රියදුරුවරයෙකු වෙත ලබාදෙමින් තිබූ වැටුප් හා දීමනා 2019 අගෝස්තු 20 දින සිට නවතා තිබුණද, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඔහුගේ වැන්දඹුවට හිමි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප හිමිගන්වා නොතිබුණි. | පොලිස් අධිකාරී කාර්යාලය විසින් වැන්දඹුව වෙත වැටුප් හා දීමනා හිමිගැන්වීම සිදු කර නොමැත. ඒ අනුව පොලිස් මූලස්ථානය සමඟ සම්බන්ධිතව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) අයවිය යුතු මුදල්**

| | | | |
|---|---|---|---|
| I. | සමෘද්ධි බැංකු සංගම් 22 ක පුද්ගල ගිණුම් 3,224 ක් මඟින් අයවිය යුතු රු.93,553,053 ක් වූ ණය මුදල් 2021 ජුනි 30 දිනට බොල් ණය බවට පත්වී තිබුණි. | බොල් ණය ප්‍රමාණය අවම කර ගැනීම සඳහා කඩිනමින් පියවර ගන්නා බව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ (වැ.බ) විසින් වාර්තා කර ඇති බව දන්වා ඇත. | ණය ලබාදීමේ අරමුණු, අවශ්‍යතාවය, ණය පියවීමේ හැකියාව, ව්‍යාපෘති ශක්‍යතාවය වැනි කරුණු පිළිබඳව සැලකිලිමත්ව ණය නිකුත් කිරීමේ කාර්යය සිදු කළ යුතු අතර පසු විපරම් කටයුතු සිදු කර ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| II. | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් III ශ්‍රේණියේ අංක 01 දරන රජයේ නිවාසයේ පදිංචිව සිටි නිලධාරියකුගෙන් රු.85,857 ක හිඟ නිවාස කුලියක් අයවීමට තිබුණි. | නිවාස කුලිය හා දණ්ඩන කුලිය අයකර එවන මෙන් සංස්කෘතික අමාත්‍යාංශය වෙත දන්වා ඇත. | හිඟ නිවාස කුලිය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **III.** | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත කොරෝනා වසංගතය හේතුවෙන් පීඩාවට පත් සමෘද්ධිලාභීන් සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන පියවර සහ සහන අරුණළු දීමනා ගෙවීම සඳහා ප්‍රජාමූල සමෘද්ධි බැංකු සංගම්වල තිබූ අරමුදල්වලින් රු.185,355,000 ක් වැයකර තිබුණි. ඉන් රු.182,834,000 ක් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන ලද විගස සමෘද්ධි බැංකු වෙත ලැබීමට නියමිත මුදල් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් අදාල මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) ඉඩම් අංශයේ කාර්යසාධනය**

| | | | |
|---|---|---|---|
| I. | ඇළහැර, හිඟුරක්ගොඩ, තමන්කඩුව, මැදිරිගිරිය හා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මැනීම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත 2013 සිට 2021 දක්වා යොමුකරන ලද මැනුම් ඉල්ලීම් 468 ක් අතුරින් රේඛා චිත්‍ර 366 ක ප්‍රමාණයක් තවදුරටත් ලැබී නොතිබුණි. | හිඟුරක්ගොඩ, ඇළහැර, මැදිරිගිරිය, තමන්කඩුව හා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වසම් මට්ටමින් මැණුම් ඉල්ලීම් ඒකරාශි කර නැවත මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරන බව දන්වා ඇත. | මැණුම් ඉල්ලීම් සඳහා චිත්‍රරේඛා කඩිනමින් ලබාගැනීම සඳහා අදාල ආයතනය සමඟ සාකච්ඡා කර විධිමත් වැඩපිළිවෙලක් සකස් කරගත යුතුය. |
| II. | 2016 සිට 2019 දක්වා වූ කාලය තුලදී සංවර්ධන කාර්යයන් සඳහා අත්පත් කර ගන්නා ලද තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පෞද්ගලික ඉඩම් කැබලි 391 ක් සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විටත් වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. 1950 අංක 09 දරණ ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය ගැසට් පත්‍රයේ පළ කළ දිනයේ සිට වන්දි මුදල් ගෙවන දිනය දක්වා කාලය සඳහා වර්ෂයකට සියයට 7 ක පොලියක්ද සමඟ වන්දි මුදල් ගෙවීමට සිදු වී තිබුණි. මෙම ප්‍රමාදය තුල රජයට අනවශ්‍ය වැය බරක් දැරීමට සිදු වීම හා ඉඩම්වල හිමිකරුවන්ට නියමිත ප්‍රතිලාභ නියමිත කාලය තුල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රතිපාදන ලද පසු ඉඩම් කැබලි සඳහා වන්දි ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇත. | කඩිනමින් වන්දි ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **III.** | ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් භූමි ප්‍රමාණයක් ජාතික අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එම ඉඩම් වල මේ වන විටත් පදිංචි වී ඇති ඉඩම් කට්ටිකරුවන් සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමට අවධානය යොමුකර නොතිබුණි. එම ඉඩම් භුක්ති විදින අනවසර පදිංචිකරුවන් විසින් 2019 සිට 2021 දක්වා කාලය තුළ ප්‍රාදේශිය ලේකම් වෙත යොමුකරන ලද අයදුම්පත් 1,352 ක් වෙනුවෙන් ඉඩම් කච්චේරි පැවැත්වීමටද කටයුතු කර නොතිබුණි. | 2000 වර්ෂයේ අංක 14.5 ගැසට් පත්‍රයේ දක්වා ඇති මායිම් සලකුණු කිරීම සම්බන්ධයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් මැනුම් ගත කර වෙන් කර ඇද්ද යන්න සොයා බැලීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත දන්වා ඇත. එසේම වනජීවී අධ්‍යක්ෂ ජනරාල් මඟින් ජාතික අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මෙම ඉඩම් සඳහා ඉඩම් කච්චේරි පැවැත්වී ම වෙනුවෙන් වන ජීවී අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාවය ඉල්ලා ලිපි යොමු කර ඇති බව දන්වා ඇත. | වනජීවී අධ්‍යක්ෂක ජනරාල් සමඟ අදාල කාරණය කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| IV. | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වර්ෂ 1 – 9 ත් අතර කාලයක් තිස්සේ රු.1,738,988 ක බදු මුදල් ගෙවා තිබුණු, බදුකරුවන් 12 කට අදාළව ඉඩම් කොමසාරිස් වෙත යොමුකර තිබුණු බදුකර මේ දක්වා ලැබී නොතිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් විමසීම් කර ඇති බව දන්වා ඇත. | ඉඩම් කොමසාරිස් වෙත යොමුකර ඇති බදුකර කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු සංගම් 22 ට අදාළව 2021 ජූනි 30 දිනට අක්‍රීය බැංකු ගිණුම් 19,437 ක රු.61,967,268 ක් ශේෂයන් පැවතුණි. මේ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව දන්වා ඇත. | අක්‍රීය තැන්පතු සක්‍රිය මට්ටමින් පවත්වාගෙන යාමට ගණුදෙනුකරුවන් පෙළඹවිය යුතුය. |

**4.** **යහපාලනය**

**4.1** **මහජනයා වෙත සේවා ඉටු කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 සහ 2021 වර්ෂවල සිදු වී ඇති වන අලිහානි 153 ක් වෙනුවෙන් වන්දි ගෙවීම් සිදු කර නොතිබුණි. | ගෙවීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | විපතට පත් අයට කඩිනමින් වන්දි ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බහුකාර්යය සංවර්ධන සහයකයින් බඳවාගැනීමේ දෙවන අදියර යටතේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 201 දෙනෙකුගෙන් ලකුණු 29 ත් 50 ත් අතර ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් 58 දෙනෙකු අතරින් පත්වීම් ලිපි ලබාදී තිබුණේ අයදුම්කරුවන් 15ක් වෙත පමණක් වන අතර, ඉතිරි පත්වීම්ලාභීන් 43 දෙනා ඇගයීම් ලකුණු 6ත් 28ත් අතර ලකුණු ලබාගත් අය වීමෙන් අභ්‍යාසලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය විනිවිදභාවයකින් තොරව සිදුකර තිබුණි. | පත්වීම්ලාභීන් තෝරා ගැනීමේ සිදුකර ඇත්තේ, බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමෙන්තුව මඟින් දන්වා ඇත. | සම්මුඛ පරීක්ෂණ වල ලකුණු පදනම් කරගෙන තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය විනිවිධ භාවයකින් සිදුකළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 11 ක්ද, | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව දන්වා ඇත. | මහජනතාවට උසස් සේවාවක් සැපයීමට සුදුසු පරිදි සේවක පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තෘතියික මට්ටමේ පුරප්පාඩු 14 ක්ද, ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 234 ක්ද පැවතුණි. එසේම ද්විතියික මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 16 ක් විය. | | |
| (ආ) | පොළොන්නරුව දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලවල සමෘද්ධි කළමණාකාර තනතුරු 66 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් 25 ක් වර්ෂ 07 කට අධික කාලයක් පුරප්පාඩුව පැවතුණි. වර්ෂ 05 කට අධික කාලයක් තිස්සේ සමෘද්ධි කළමණාකරුවන් 09 දෙනෙකු වැඩ බැලීමේ තනතුරු වල නිරත වී තිබුණි | පවතින පුරප්පාඩු සම්බන්ධව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇති බව දන්වා ඇත. | - එම - |